සැ. යු. - 2023.01.13 දින පළකරන ලද අංක 2315 ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නෙවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,316 - 2023 ජනවාරි මස 20 වැනි සිකුරාදා - 2023.01.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 24 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 පෙබරවාරි මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජනවාරි මස 27 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

23- B 082420 — 353 (2023/01)
D 1 -

# විවිධ දැන්වීම්

## ප්‍රඥබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

රූපසිංහගේ ප්‍රදීප් සමන් කුමාර උඳුගොඩ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ප්‍රඥබන්දු ශිෂ්‍යත්ව භාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ශිෂ්‍යත්ව භාර අරමුදල සංස්ථාගත කිරීමයි :-

01. තම ප්‍රාථමික අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති සුදුසුකම් ලත් තරුණ තරුණියන්ට, තත්වය අනුව, ඔවුන්ගේ කාර්මික සහ/හෝ තාක්ෂණික සහ/හෝ වෘත්තිය කුසලතා සහ තාක්ෂණික සහ/හෝ උසස් අධ්‍යාපන ආයතනයක නිපුණතා වර්ධනය කර ගැනීම සඳහා උසස් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට හැකි වන පරිදි මූල්‍යාධාර සැපයීම වස් ශිෂ්‍යත්ව ලබා දීම;

02. වෙනත් අධ්‍යාපනය ක්ෂේත්‍ර සහ/හෝ ආයතන සහ/හෝ තාක්ෂණික කළමනාකරණ සහ/හෝ උසස් අධ්‍යාපන ආයතන, පාසල්, පදනම් සහ අධ්‍යාපනයේ සහ/හෝ වෙනත් උසස් අධ්‍යාපනයේ ඉදිරි ගමනේ නියැලී සිටින ඒ හා සමාන ආයතන පිහිටුවීම සහ/හෝ පිහිටුවීමට සහාය වීම ;

03. කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ තාක්ෂණික අධ්‍යාපනයේ දියුණුවෙ හි නියැලී සිටින එවැනි පුද්ගලයින්ගේ කුසලතා සහ නිපුණතා සංවර්ධනය හා වැඩි දියුණු කිරීම සඳහා ආධාර සැපයීම ;

04. අරමුදලේ ඉලක්ක සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලුම සහ/හෝ වෙනත් දේවල් කිරීම ;

යනාදිය වේ.

ප්‍රදීප් උඳුගොඩ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

01-185

---

## එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

කුමාරසිරි රත්නායක වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "එස් ඕ එස් ළමා ගම්මාන ශ්‍රී ලංකා සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* ශ්‍රී ලංකාද්වීපය තුළ එස් ඕ එස් ළමා ගම්මාන පිහිටුවීම ;

*(ආ)* එස් ඕ එස් ළමා ගම්මාන තුළ ජීවත්වන දරුවන් හට පවුලක ආකාරයේ පූර්ණ රැකවරණය ලබා දීම ;

*(ඇ)* මව්වරුන් සහ ළමයින් උදෙසා ප්‍රජා මධ්‍යස්ථාන පිහිටුවීම, හර්මන් මයිනර් විදුහල් පිහිටුවීම හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම ;

යනාදිය වේ.

කුමාරසිරි රත්නායක,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මොනරාගල දිස්ත්‍රික්කය.

01-184

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.